- **අම්මේ තාත්තේ , මෙම කතාව දරුවන්ට කියා දෙන්න.**

අපි හරි යාළුයි

එක කැලෑවක අලි පැටියෙකුයි හා පැටියෙකුයි බොහොම යාළුකමින් සිටියා. මේ දෙන්නා සෙල්ලම් කළේ හරිම සමගියෙන්. එක්කෙනෙකුට අනිත් කෙනා නැතුව ඉන්න බෑ. හැමදාම හවසට සෙල්ලම් කරන්න මේ දෙන්නා ගමේ පිට්ටනියට එනවා. බැරිවෙලා හරි සෙල්ලම් කරන වේලාවටඑක්කෙනෙකුට එන්න ප්‍රමාද වුණොත් අනිත් කෙනා ඉන්නෙ හරිම නොඉවසිල්ලෙන්. හැමදාම හා පැටියා උදෙන් ම ඉස්කෝලෙ යනවා. අලි පැටියා තමයි හා පැටියව ඉස්කෝලෙට ගෙනියන්නෙ. හා පැටියා අලි පැටියගෙ පිට උඩ නැගගෙන ඉස්කෝලෙ යන්නෙ පුදුම සතුටකින්. හා පැටියාව ඉස්කෝලෙ ගේට්ටුව ළඟ දි බැහැල යනකොට අලි පැටියට හරිම දුකයි. ඒ දුකට අලි පැටියා පැත්තකට වෙලා අඬන වෙලාවලුත් තියෙනවා. දවසක් හා පැටියා අලි පැටියගේ ඇස්වල තිබුණු කඳුළු දැක්කා. 'ඇයි මගේ යාළුවේ. ඔයාට මම නැතුව පාළුයි ද ? ඒකද මේ අඬන්නේ ?' කියල හා පැටියා ඇහුවා. 'මට ගොඩක් දුකයි හා පැටියො. මමත් ආසයි ඔයා වගේ ඉස්කෝලෙ යන්න.' අලි පැටියා කිවුවා. 'හරි. මමත් ආසයි ඔයා මගේ පන්තියේ ම ඉන්නව නම්. මම අපේ ගුරුතුමීගෙන් අහන්නම්' යැයි හා පැටියා පැවසුවා. එදා හා පැටියා ඉස්කෝලෙ ගිහිං මේ විස්තරේ ගුරුතුමීට කිවුවා. 'ඊළඟ දවසේ ඉඳන් ඔයාගේ යාළුවටත් ඉස්කෝලෙට එන්න කියන්න.' ගුරුතුමී පැවසුවා. හා පැටියා එදා ඉස්කෝලෙ ඇරෙනකම් ඉවසිල්ලක් නැතුව හිටියේ මේ පණිවුඩේ අලි පැටියාට කියන්න. ඉස්කෝලෙ ඇරුණු ගමන් ම ගෙදර ගිහිං සෙල්ලම් කරන වේලාව එනතුරු නොසිට හා පැටියා පිට්ටනියට ගියා. එදා වෙලාව යන්නෑ කියලයි හා පැටියට දැණුනේ. මෙන්න අලි පැටියා එනවා. හා පැටියා අලි පැටියට පණිවිඩය කිවුවා. අලි පැටියට හරිම සතුටුයි. ඒ සතුටටත් එක්ක දෙන්න ම බොහෝ වෙලා යනකම් සෙල්ලම් කළා. පසුවදා ඉඳන් අලි පැටියයි හා පැටියයි දෙන්න ම ඉස්කෝලෙ ගියෙත් එකට. ආවෙත් එකට මයි.

පිළිතුරු දෙන විට මුහුණු පැලඳි ඇඟිල්ල චලනය කොට පිළිතුරු දීමට සිසුන්ට පවසන්න.

අත් ඇඟිලිවල මූණු ඇඳගන්න.

අත් ඇඟිලි භාවිත කරමින් රූකඩයක් මෙන් රඟ දක්වන්න.

ළමයා : රන් කුඹලෝ //
කුඹලා : ඇයි ළමයෝ //
ළමයා : මොකට ද ඔය මැටි ගුළියක්
කුඹලා : ගේ හදන්න ගෙනාව මං
ළමයා : කොහේ ද ඔය ගේ හදන්නෙ
කුඹලා : උළුවස්සෙයි ගේ හදන්නෙ
ළමයා : මගේ පුටුව යට හදන්න
කුඹලා : අම්ම ඒක කඩයි නේද ?
ළමයා : නැහැ කඩන්න දෙන්නෑ මං
කුඹලා : ඔයා ගොඩක් හොඳ ළමයෙක්
ළමයා/කුඹලා : අපි දැන් හොඳ යාළුවෝ . . .//